**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**I වාර පරීක්ෂණය - 2008**

**පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - 11 ශ්‍රේණිය**

**කාලය පැය 3**

## I පත්‍රය

1. සියලු දෙනා එක්ව පාලන කටයුතු පිළිබඳ තීරණ ගැනීම හා සම්බන්ධ පැරණි ග්‍රීසියේ පැවැති ප්‍රජාතන්ත්‍රවාදය වන්නේ,
   - i. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය
   - ii. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය
   - iii. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය
   - iv. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය

2. ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සැලකන්නේ,
   - i. මහා බ්‍රිතාන්‍ය
   - ii. ග්‍රීසිය
   - iii. රෝමය
   - iv. ස්විස්ටර්ලන්තය

3. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණයක් නොවන්නේ මින් කවරෙක්ද?
   - i. රටේ සියළුම පුරවැසියන්ට සමාන අයිතීන් හිමිවේ.
   - ii. ජනතා ඡන්දයෙන් තෝරනු ලබන නියෝජිතයන් මගින් රට පාලනය කෙරේ.
   - iii. නියමිත කාලයට නියමිත ලෙස මැතිවරණ පැවැත්වේ.
   - iv. රට පාලනයේදී පාලක පංතියට උවමනා පරිදි තීරණ ගනී.

4. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් නොවන්නේ මින් කවරක්ද?
   - i. ප්‍රාරම්භය
   - ii. පුනරාවර්ථනය
   - iii. ජනාධිපතිවරණය
   - iv. ජනමත විචාරණය

5. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන අංග ලක්ෂණයකි රට මැතිවරණ කොට්ඨාශවලට බෙදා වෙන් කිරීම. දැනට ශ්‍රී ලංකාවේ ඇති මැතිවරණ කොට්ඨාශ ගණන වන්නේ,
   - i. 23
   - ii. 22
   - iii. 25
   - iv. 24

6. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට නම් දේශපාලන පක්ෂ ක්‍රමයක් අත්‍යවශ්‍යය. දේශපාලන පක්ෂයක් යනු,
   - i. රාජ්‍ය බලය ලබාගෙන රට පාලනයට කැමැත්තෙන් සිටින පිරිසකි.
   - ii. විප්ලවයක් මගින් රටේ ආණ්ඩු බලය අල්ලා ගැනීමට කටයුතු කරන කණ්ඩායමකි.
   - iii. කිසියම් ප්‍රතිපත්ති මාලාවක් යටතේ රටේ දේශපාලන බලය ලබා ගැනීමට සංවිධානය වූ පිරිසකි.
   - iv. නිතර නිතර ආණ්ඩු පක්ෂයක් අනෙක් පක්ෂත් කරන කාර්යයන් විවේචනය කිරීමට සැදි පැහැදි සිටින කාණ්ඩායමකි.

7. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලය විසින් සම්පාදනය කර ව්‍යවස්ථාදයකය අනුමත කරනු නොලැබූ ව්‍යවස්ථා ලෙස හැඳින්වේ. ලෝකයේ අලිඛිත ව්‍යවස්ථවක් නොමැති රටක් වන්නේ,

i. මහා බ්‍රිතාන්‍ය ii. ප්‍රංශය iii. ඊශ්‍රාලය iv. නවසීලන්තය

8. නීතියේ ආධිපතිත්වය යන්නෙන් අදහස් කරන්නේ,

i. පාලිතයාට සාධරණය ඉටු කිරීමයි.

ii. නීතියට අනුව පාලනය කිරීමයි.

iii. විශේෂිත පුද්ගලයන්ට නීතිය ඉදිරියේ සහන සැලසීමයි.

iv. පාලක පක්‍ෂය වෙනුවෙන් නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වීමයි.

9. රාජ්‍යය සතු මූලික අංග 4 වන්නේ,

i. භූමිය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය, විරුද්ධ පක්ෂය

ii. ආණ්ඩුව, ස්වාධිපත්‍යය, ජනගහනය, දේපල

iii. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය

iv. ජනගහනය, භූමිය, පාර්ලිමේන්තුව, ස්වාධිපත්‍යය

10. ඒකීය රාජ්‍යයකට අයත් නොවන ලක්‍ෂණය කුමක්ද?

i. තනි ආණ්ඩුවක් මගින් අභ්‍යන්තර හා බාහිර කටයුතු මෙහෙය වන ආකාරයට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සකස් කර තිබේ.

ii. පලාත් පාලන ආයතන වලට ලබාදී ඇති බලතල මධ්‍යම ආණ්ඩුවට උවමනා වූ පටක නැවත ලබාගත හැක.

iii. අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල දැකිය නොහැක.

iv. මධ්‍යම ආණ්ඩුව උත්තරීතර භාවයෙන් තොරය.

11. ඒකීය රාජ්‍යයන් හි බලය විමධ්‍යගත කිරීමේදී රටවල් අනුගමනය කරන ප්‍රධාන ක්‍රම ඇත්තේ,

i. තුනකි ii. දෙකකි iii. හතරකි iv. පහකි

12. ඒකීය රාජ්‍යයනහි බලය බෙද හැරීමේ ක්‍රමයක් ලෙස ප්‍රාදේශිය පාලන කටයුතු "දෙපාර්තමේන්තු" සහ "ඇරොන්ඩිසෙමන්ට්" යටතේ සිදු කරන රට වන්නේ,

i. මහා බ්‍රිතාන්‍යය ii. ප්‍රංශය

iii. ඉතාලිය iv. අ.එ.ජ

13. ඇමරිකානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ යම් සංශෝධනයක් කරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය වන්නේ,

i. මධ්‍යම ආණ්ඩුවේ කොංග්‍රසයේ $2/3$ ක හා ප්‍රාන්ත රාජ්‍යවල $3/4$ ක කැමැත්තයි.

ii. කොංග්‍රසයේ $1/2$ ක හා ප්‍රාන්ත රාජ්‍යවල $2/3$ ක කැමැත්තයි.

iii. කොංග්‍රසයේ $3/4$ ක කැමැත්ත හා ප්‍රාන්ත රාජ්‍ය $2/3$ ක කැමත්තයි.

iv. කොංග්‍රසයේ $1/3$ ක කැමැත්ත හා ප්‍රාන්ත රාජ්‍ය $3/4$ ක කැමත්තයි.

14. ඉන්දීය ව්‍යවස්ථාවේ 249, 250, 251 යන වගන්ති තුනෙන් කර ඇත්තේ,

    i. ප්‍රාන්ත රාජ්‍ය වලට ලබාදී ඇති බලතල පැහැදිලි කිරීමයි.
    ii. මධ්‍යම ආණ්ඩුවේ බලතල පැහැදිලි කිරීමයි.
    iii. ප්‍රාන්ත රාජ්‍ය වල බලතල සීමා කිරීමයි.
    iv. ජනාධිපතිවරයාගේ බලය විස්තර කිරීමයි.

15. ලංකාවේ බලය විමධ්‍යගත කරණයෙහි අවස්ථා කීපයක් පහත දැක්වේ. ඒවා අනුපිළිවෙලින් පෙළ ගැස්වූ විට සකස් විය යුතු වන්නේ,

    a. ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ පළාත් පාලනය සම්බන්ධ විධායක කාරක සභාව පිහිටු වීම.
    b. මහ නගර සභා ආඥා පනත හඳුන්වාදීම.
    c. පළාත් සභා පිහිටුවීම/ප්‍රාදේශීය සභා පනත හඳුන්වා දීම.
    d. නගර සභා පිහිටුවීම.
    e. දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම.

    i. c b a d c    ii. b d a e c    iii. a e d c e    iv. b a d c e

16. බලය විමධ්‍යගත කිරීම සඳහා යෝජනාව ඉදිරිපත් වූයේ

    i. බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමෙන්
    ii. ඉන්දු ලංකා ගිවිසුමෙන්
    iii. ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුමෙන්
    iv. ඩොනමෝර් කොමිසමේ යෝජනාවලින්

17. පළාත් සභාවක ආණ්ඩුකාර ධූරය පත් කරනු ලබන්නේ,

    i. පළාත් සභාවේ ඡන්දයෙනි    ii. ජනාධිපතිවරයා විසිනි
    iii. අගවිනිසුරුවරයා විසිනි    iv. මහ ඇමතිවරයා විසිනි

18. ලෝකයේ බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවද බහු සංස්කෘතික ජන සමාජයකි. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට බල නොපාන හේතු සාධකය කුමක්ද?

    i. සංස්කෘතික සම්කර්පනය    ii. විගමනය
    iii. විසරණය    iv. සංක්‍රමණ

19. ධනවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණයක් නොවන්නේ මින් කුමක්ද?

    i. මිල ක්‍රමය මත පදනම්ව ආර්ථික කටයුතු මෙහෙය වීම.
    ii. ව්‍යවසායකයා ලාභ ලැබෙන දේ පමණක් නිපදවයි.
    iii. පෞද්ගලික දේපල ක්‍රමයට විරුද්ධය.
    iv. ධනපති සහ නිර්ධන යන පංති 2 ක් ඇත.

20. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නමින් 1992 සිට හැඳින්වෙන්නේ

i. නිදහස් වෙළඳ කලාපයි ii. ආයෝජන ප්‍රවර්ධන කලාපයි

iii. මහ කොළඹ ආර්ථික කොමිසමයි iv. අපනයන සැකසුම් කලාපයි.

21. ගෝලීයකරණය හා සම්බන්ධ නොගැලපෙන ප්‍රකාශය කුමක්ද?

i. මුළු ලොවම එකම ගම්මානයක් හෙවත් විශ්ව ගම්මානයක් බවට පත්වෙයි.

ii. සන්නිවේදන ප්‍රවාහනය විදේශ වෙළඳම ආදී ක්ෂෙත්‍ර ඔස්සේ ලෝකය තනි ආර්ථිකයක් බවට පත්වීමේ ප්‍රවනතාවය ඇත.

iii. විදේශ භාණ්ඩ අපනයනය සීමා කොට දේශිය නිෂ්පාදන දිරි ගැන්වීමට අනුබල දේ.

iv. දේශසීමා බිඳී ගොස් මිනිසුන් එකම භාෂාවක් කතා කරන එකම සංස්කෘතියක් ඇති එම මූල්‍ය ඒකකයක් මගින් ගනුදෙනු කරන තත්වයට සංකෝචනය වීමේ ප්‍රවනතාව ඇත.

22. 2005 වර්ෂයේ එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩ සටහන සැකසූ මානව සංවර්ධන වාර්තාව අනුව රටවල් 177ක් අතුරින් ප්‍රමුඛස්ථානය ලබාගෙන ඇත්තේ,

i. ස්වීඩන් ii. ස්විට්සර්ලන්තය

iii. බෙල්ජියම iv. නෝර්වේ

23. "රාජ්‍යයේ භූමිකාව නීතිය හා සාමය ආරක්ෂා කිරීමය" යනුවෙන් රාජ්‍යයට පොලිස් නිලධාරියෙකුගේ බලතල පවරා අදහස් දක්වූ දර්ශනිකයෙක් නොවන්නේ මින් කවරෙක්ද?

i. තෝමස් හොබ්ස් ii. ජෝන් ලොක්

iii. ජින් ජැක්සන් රූසෝ iv. මැක් අයිවර්

24. කාර්මික ධනවාදයේ නැගී සිටීමත් සමග පීඩනයට පත්වූ ජනතාව, ව්‍යවසායක පන්තියෙන් අයකරන බදු මුදලින් සුභ සාධනය කළ යුතු යැයි යෝජනා කළ දේශපාලන මතවාදය වූයේ

i. පැරණි ලිබරල් වාදය ii. නව ලිබරල් වාදය

iii. නූතන ලිබරල් වාදය iv. සමාජවාදය

25. නූතන ලිබරල් වාද මත ක්‍රියාත්මක කළ අයෙකු වන්නේ,

i. මාග්‍රට් තැචර් ii. මිල්ටන් ෆ්‍රිඩ්මාන්

iii. රිචඩ් නික්සන් iv. ෆ්‍රාන්සිස් ෆුකුයාමා

26. "බලය විමධ්‍යගතකරණිය" යන්නට අදල නොවන ප්‍රකාශය කුමක්ද?

i. පරිපාලනමය බලතල පමණක් ප්‍රාදේශිය මට්ටමින් පවරා දෙනු ලැබේ.

ii. බලය විමධ්‍යගත කරනු ලබන්නේ ආ.ක්‍රම. ව්‍යවස්ථාවෙන් නොව පාර්ලිමේන්තුවෙන් සම්මත කරන පනතක් මගිනි.

iii. ඕනෑම අවස්ථාවක පවරා දුන් බලතල මධ්‍යම ආණ්ඩුවට පවරා ගත හැක.

iv. මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාදේශිය පාලන ඒකක වෙත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් බෙද වෙන්කර දෙනු ලැබේ.

27. රාජ්‍යයක උත්තරීතර නීතිය ලෙස සැලකෙන්නේ,

i. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවයි. ii. දණ්ඩ නීති සංග්‍රහය

iii. ශ්‍රේෂ්ඨාධිකරණය දෙන තීන්දුව iv. ජනාධිපතිතුමාගේ නියෝගය

28. මිනී මැරුම්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂන, සොරකම යනාදිය අයත් වන්නේ,

i. සිවිල් නීතියට ii. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතියට

iii. අපරාධ නීතියට iv. සාමාන්‍ය නීතිය

29. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වන්නේ,

i. අගවිනිසුරු ii. නීතිපති

iii. සොලිස්ටර් ජනරාල් iv. ජනාධිපති

30. ශ්‍රි ලංකා ඉහලම උසාවියෙන් දෙනු ලැබු තීන්දු පිළිබඳව එංගලන්තයේ රාජාධිකරණයට අභියාචන කළ හැකි වූයේ,

i. ඉංග්‍රිසි අධිකරණ රටාවට අනුව

ii. යටත් විජිත යුගයේ අධිකරණ පද්ධතියට අනුව

iii. පෘතුග්‍රිසි අධිකරණ රටාවට අනුව

iv. ලන්දේසි අධිකරණ රටාවට අනුව

31. ශ්‍රි ලංකාවේ අවසාන අභියාචනාධිකරණ බලය ඇත්තේ,

i. අභියාචනාධිකරණයට ii. මානව හිමිකම් කොමිෂන් සභාවට

iii. ඔම්බුඩ්ස්මන් වරයාට iv. ශ්‍රේෂ්ඨාධිකරණයට

32. සිවිල් ආරවුල් ගම් මට්ටමේදීම විසඳලීමට විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස ස්ථාපිත කර ඇති ආයතනය වන්නේ.

i. ප්‍රාථමික අධිකරණය ii. සමථ මණ්ඩලය

iii. සංවර්ධන සමිති iv. උපදේශක සේවාවන්

33. පරිපාලන අසාධාරණයන්ගෙන් මෙන්ම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය මේ තුලින් ද පුරවැසියා මුදවා ගැනීමට ඇතිකර ඇති විශේෂ ධූරය වන්නේ,

i. ඔම්බුඩ්ස්මන් ii. විගණකාධිපති

iii. මහාභාරකරු iv. නීතිපති

34. සිවිල් අයිතිවාසිකම් නොවන්නේ මින් කුමක්ද?

i. අධ්‍යාපන ලැබිමේ අයිතිය

ii. ආණ්ඩුව විවේචනය කිරීමේ අයිතිය

iii. දේපල එක්රැස් කිරීමේ අයිතිය

iv. කැමති ආගමක් ඇදහීමේ අයිතිය

35. "මිනිසාට සිය සමාජ ජීවිතය යහපත් අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය කොන්දේසි මාලාව අයිතිවාසිකම් වේ"

i. ඒබ්‍රහම් ලින්කන් ii. කේ.සී. පියර්

iii. ඩී.ජී.එච්. කෝල් iv. හැරල්ඩ් ජේ. ලැස්කි

36. "රජය විසින් ක්‍රියාත්මමක කරනු ලබන අයිතිවාසිකම් හා යුතුකම් සමුදයකි" නීතිය හැඳින්වීම සඳහා ඉහත ප්‍රකාශය කර ඇත්තේ,

i. බවුන්ට් ii. ග්‍රීන්

iii. සලමන්ඩ් iv. ඔක්ස්නාර්ඩ් විශ්ව කෝෂය

37. ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳව ඉහලම තලයේ සිටින ප්‍රධාන භූමිකා තුන වන්නේ,

i. අග විනිසුරුතුමා, සොලිස්ටර් ජනරාල්, නීතිපති

ii. අග විනිසුරුතුමා, අධිකරණ අමාත්‍යවරයා, නීතිපති

iii. අග විනිසුරුතුමා, නීතිපති, ඔම්බුඩ්ස්මන්

iv. අග විනිසුරුතුමා, නීතිපති, ඔම්බුඩ්ස්මන්

38. ශ්‍රී ලංකාවේ ප්‍රථම නීතිපති වරයා වූයේ,

i. රොබට් වෝල්පෝල් ii. කමලසවේසන්

iii. ශ්‍රීමත් විලියම් ඕගල්කා iv. එමරසන් ටෙනන්ට්

39. ශ්‍රේෂ්ඨාධිකරණය සමන්විත වන විනිශ්චය කරුවරු සංඛ්‍යාව වන්නේ

i. දහ දෙනෙකුට නොඅඩු දහසය දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකි

ii. එකලොස් දෙනෙකුට නොඅඩු දහසය දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකි

iii. හය දෙනෙකුට නොඅඩු එකොලොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකි

iv. දහ දෙනෙකුට නොඅඩු දෙලොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකි

40. හබයාස්කෝපුස් රිට් ආඥා ලබාදීමේ බලය ඇත්තේ,

i. දිසා අධිකරණයටය ii. අභියාචනා අධිකරණයටය

iii. මහාධිකරණයටය iv. මහේස්ත්‍රාත් අධිකරණයටය

(ලකුණු 40)

## II පත්‍රය

ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු ලියන්න.

1. i. ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 04)

   ii. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය උපක්‍රම 2ක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 05)

   iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක 3ක් නම් කොට විස්තර කරන්න. (ල 06)

2. i. රාජ්‍යයක් සමන්විත වන ප්‍රධාන අංග 4 නම් කරන්න. (ල 04)

   ii. ආණ්ඩුවක් සමන්විත වන ප්‍රධාන කොටස් තුන නම් කොට ඒ එකිනෙකින් කෙරෙන කාර්යය පැහැදිලි කරන්න. (ල 05)

   iii. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ඇති ප්‍රධාන ලක්ෂණ 3ක් දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ල 06)

3. i. බලය විමධ්‍යගතකරණය සහ බලය බෙදා හැරීම ධන සංකල්ප දෙක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 04)

   ii. ඒකීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ 2ක්ද සංධීය රාජ්‍යක ප්‍රධාන ලක්ෂණ 2 ක්ද පැහැදිලි කරන්න. (ල 05)

   iii. ඒකීය රාජ්‍යයක බලය විමධ්‍යගතකරණ ප්‍රධාන ආකාර තුන පැහැදිලි කරන්න. (ල 06)

4. i. ලංකාවේ බලය විමධ්‍යගත කිරීමට උත්සාහ ගත් අවස්ථා 4ක් නම් කරන්න. (ල 04)

   ii. පලාත් සභාවක සැකැස්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 05)

   iii. පලාත් සභා ක්‍රමය ඔබ පලාතේ සංවර්ධනයට සහභාගි වී ඇති අයුරු කරුණු 2ක් යටතේ සාකච්ඡා කරන්න. (ල 06)

5. i. බහු සංස්කෘතික ජන සමාජයක් ඇතිවීමට බලපාන සාධක 4ක් නම් කරන්න. (ල 04)

   ii. ප්‍රධාන අර්ථ ක්‍රම නම් කොට ඉන් එක් ක්‍රමයක් පිළිබඳව පැහැදිලි කරන්න. (ල 05)

   iii. වෙළඳපල ආර්ථික සංකල්පයේ යහපත් ලක්ෂන 2 බිඳ අයහපත් ලක්ෂන 2ක්ද දක්වා ඒවා පැහැදිලි කරන්න. (ල 06)

6. i. නීති බිහිවීමේලා බලපාන මූලාශ්‍ර 4ක් නම් කරන්න. (ල 04)

   ii. අධිකරණයේ ස්වාධිනතාව උදෙසා ගෙන ඇති පියවර 3ක් නම් කර පැහැදිලි කරන්න. (ල 05)

   iii. ලංකාවේ ඇති අධිකරණ වර්ගීකරණය ඉදිරිපත් කර ඉන් 2ක් පිළිබඳ විස්තර කරන්න. (ල 06)

7. එක කොටසකින් එකක් ගැන තෝරා ගෙන මාතෘකා 3ක් ගැන කෙටි සටහන් ලියන්න.

   i. නීතිපති ii. සමථ මණ්ඩල iii. මානව හිමිකම් කොමිසන් සභාව

   iv. අගවිනිසුරු v. අපරාධ නීතිය vi. ඔම්බුඩ්ස්මන්